අමාත්‍යාංශ චක්‍රලේඛ අංක:97/21.

මගේ අංකය:2/පිරි1/14,
පිරිවෙන් හා ආගමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය',
බත්තරමුල්ල.
1997-10- 13 වෙනි දින.

සියලුම පිරිවෙන්වල කෘත්‍යාධිකාරී හා -
-පරිවේණාධිපති ස්වාමීන්වහන්සේලා වෙත.

## පිරිවෙන් ගුරුවරුන් අනුමත කිරීම.

1994-10-06 දින සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ගුරු සේවයට සමාන්තරව පිරිවෙන් ගුරුවරුන් සඳහා ද වෙනම ගුරු සේවාවක් සකස් වෙමින් පවතී. එතෙක් අමාත්‍යාංශ චක්‍රලේඛ 95/27 පරිදි දැනට පිරිවෙන් ගුරුවරුන්ට ඒ සමානව වැටුප් පරිමාණයන් ලබාදී තිබේ. මේ අනුව ශ්‍රී ලංකා ගුරුසේවයේ ව්‍යවස්ථාවන්ට සමානව අදාල අවස්ථාවන්හිදී පිරිවෙන් ගුරුවරුන්ගේ සේවා කොන්දේසි ද ක්‍රියාත්මක විය යුතුය. එබැවින් පිරිවෙන් ගුරුවරුන් බඳවා ගැනීමේදී ශ්‍රී ලංකා ගුරුසේවා ව්‍යවස්ථාවේ සඳහන් පහත දැක්වෙන අවම අධ්‍යාපන සුදුසුකම් 1994-10-06 දින සිට බඳවාගනු ලබන පිරිවෙන් ගුරුවරුන් සඳහා ද ක්‍රියාත්මක කිරීමට පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය උපදෙස් දී ඇත.

"අවම අධ්‍යාපන සුදුසුකම්.

විශ්ව විද්‍යාලයකට ඇතුළත්වීම සඳහා සුදුසුකම් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සමත් වී තිබීම."

02. පිරිවෙන්වල ඉංග්‍රීසි හා ගණිතය විෂය ඉගැන්වීම සඳහා බඳවා ගනු ලබන ගුරුවරුන් දැනට එම විෂයයන් සඳහා සපුරා තිබිය යුතු සුදුසුකම්වලට අමතරව ඉහත සුදුසුකම ද සම්පූර්ණ කර තිබිය යුතුය. උදාහරණයක් වශයෙන් ඉංග්‍රීසි විෂය සඳහා බඳවාගනු ලබන ගුරුවරුන් අ.පො.ස. (සා.පෙළ) හෝ මූලික පිරිවෙන් අවසාන විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව හෝ ඉංග්‍රීසි සාහිත්‍ය විෂය සාමාන්‍ය සාමාර්ථයක් සහිතව සමත් විය යුතු අතර, අ.පො.ස. (උ.පෙළ) විභාගය ද විශ්ව විද්‍යාලයට ඇතුළත්වීමේ අවම ලකුණු සහිතව සමත් වී තිබිය යුතුය. ගණිතය විෂය සඳහා බඳවාගනු ලබන ගුරුවරුන් ද ශුද්ධ ගණිතය විෂය සමග ඉහත සඳහන් පරිදි අ.පො.ස.(උ.පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය.

03. 1994-10-6 දිනෙන් පසුව උක්ත සුදුසුකම නොමැතිව බඳවාගෙන දැනට අනුමතව සේවයේ යෙදෙන ගුරුවරුන් සියලු දෙනාට එකී සුදුසුකම සපුරා ගැනීමට 1999-12-31 දින දක්වා කල්දෙනු ලැබේ. එසේ නොවුනහොත් ඔවුන් පිරිවෙන් ගුරුසේවය ක්‍රියාත්මක වනවිට නියමිත ශ්‍රේණියේ තබා පත්වීම අනුමත ලිපි නිකුත් කිරීම කළ නොහැකි වනු ඇත.

04. පිරිවෙන්වලට දැනට ගුරුවරුන් අනුමත කරනු ලබන්නේ පුරප්පාඩු(ඇබෑර්තු) සඳහා පමණි. පිරිවෙනක ගුරු ඇබෑර්තුවක් ඇතිවූ විට එයට ගුරුවරයකු පත්කර ගැනීමට අවශ්‍ය වේනම් සුදුසුකම් ඇති ගුරුවරයකු පත්කර ගැනීම සඳහා අදාල පිරිවෙන් පරීක්ෂක හිමිට/මහතාට ඒ බැව් දැනුම් දී උපදෙස් ලබාගත යුතුය. ගුරුවරයා පත්කර ගතයුත්තේ හුදෙක් අධ්‍යාපන අවශ්‍යතා මත පමණක් බැව් සැලකිය යුතුය.

අ.කළේ/පී.ජී. දයාරත්න.
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ-
වැ.බ.ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්).

පිටපත්:- 1. සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත -කලාපභාර නි.අ.අ.වරුන් දැනුවත් කිරීමට.
11. සියලුම පිරිවෙන් පරීක්ෂකවරුන් වෙත.